**ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය - 2017**

-----------------------------------------------------------------------------------

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 56(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 අහිතකර මතය

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

-----------------------------------------------

(i) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුල වසර ගණනාවක සිට සංචලනය නොවන එකතුව රු.784,037,781 ක් වූ ගිණුම් ශේෂ 05 ක් පැවති අතර ප්‍රමිතයේ 95(ඇ) ඡේදය ප්‍රකාරව එම ගිණුම්වල ස්වභාවය හා අරමුණ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 119 ඡේදයට අනුකූලව රජයේ ප්‍රදාන හා වෙනත් ප්‍රදාන ලෙස, ප්‍රදාන වර්ගකර හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ඇතුලත් කල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන රු.78,800,000 ක් සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති හිමිකම් වටිනාකමට සහ සංයුතියට ගැලපෙන ආකාරයට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

(iii) වෙනත් ආදායම් රු.60,476,914 ක් හා රු.48,310,950 ක් වූ උපචිත වියදම් එක් එක් ආදායම් හෝ වියදම් විෂයය නිරූපනය වන ආකාරයට ගිණුම්ගත කිරීමකින් තොරව අදාල ආදායම් හෝ වියදම් ඉපයූ හෝ දැරූ අංශ අනුව විග්‍රහ කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

-----------------------------------------------

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ යටතේ මුදල් ගලායාම් ලෙස රු.18,840,339 ක් දැක්විය යුතු වුවත් එය රු.11,710,672 ක් ලෙස දක්වා තිබුණි.

(ii) අධිකාරිය විසින් ඉපයූ ආදායමින් අර්ධ කාලීන පාඨමාලා වෙනුවෙන් වර්ෂය තුල මිලදීගත් රු.1,486,375 ක් වටිනා ස්ථාවර වත්කම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යෑමක් ලෙස දක්වා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

-----------------------------------------------

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව තක්සේරු නොකිරීම හේතුවෙන් පිරිවැය රු.91,309,747 ක් වූ මෝටර් රථ 40 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) අධිකාරිය සතු රු.3,259,307,574 ක් පිරිවැය වූ ඉඩම්, ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා පුහුණු උපකරණ ඇතුලු ස්ථාවර වත්කම් ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා "ටැලි" නැමති ගිණුම්කරණ පැකේජය 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පැවති නමුත් ගනුදෙනු නිවැරදිව ලෙජර් ගිණුම්වලට සටහන් නොකිරීම හේතුවෙන් පැකේජය මගින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට 2017 වර්ෂය වන විටත් අධිකාරිය අපොහොසත් වී තිබුණි. කෙසේ වුවද පැකේජය තුලින් ලබාගත් ශේෂ පිරික්සුම පදනම්කර ගෙන මූල්‍ය ප්‍රකාශන අතින් (Manual) පිළියෙල කර තිබූ නමුත් එම ශේෂ පිරික්සුමේ ඇතුලත් ගිණුම් ශේෂ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමේ ඇතුලත්ව තිබූ එකතුව රු.158,925,745 ක් වූ හර ශේෂ හා රු.1,417,252 ක් වූ අවිනිශ්චිත ගිණුමක්ද ඇතුලත් රු.249,578,131 ක් වූ බැර ශේෂ, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා යොදා ගෙන නොතිබුණි.

(ii) ශේෂ පිරික්සුමේ දක්වා නොතිබූ රු.518,136 ක් හා රු.3,072,105 ක් වූ අවිනිශ්චිත ගිණුම් ශේෂ 02 ක් පිළිවෙලින් සමුච්චිත අරමුදල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයට අදාල රු.143,056,895 ක් වූ ඌනතාවය සහ 2017 දෙසැම්බර් 31 දිනට ඉහත ඌනතාවයද ඇතුළත් සමුච්චිත අරමුදල් ශේෂය වූ රු.869,815,126 ක් ද ශේෂ පිරික්සුමට ඇතුළත් කර තිබීම හේතුවෙන් එම ශේෂ පිරික්සුම විගණනය කිරීම සඳහා පිළිගත හැකි විධිමත් ශේෂ පිරික්සුමක් ලෙස සැලකීමට නොහැකි විය.

උක්ත ඌනතාවයන් හේතුවෙන් අධිකාරිය විසින් පවත්වාගෙන යන ගිණුම්කරණය පිළිබඳ විශ්වාසය තැබිය නොහැකි බැවින් මූල්‍ය ප්‍රකාශනවල ඇති ගනුදෙනු හා ශේෂයන්ගේ නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

(ආ) ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවා තිබුණු එකතුව රු.3,116,971 ක් පෙර වර්ෂ ගැලපුම් ලෙස ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) අධිකාරියේ ගණනය කිරීම් අනුව, 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සේවක ජීවන වියදම් දීමනාව මත ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දළ වශයෙන් රු.172,549,951 ක් වුවද ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් හෝ සටහන් මගින් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඈ) පාරිතෝෂික සඳහා වෙන්කිරීම් නොකරන ලද නිලධාරියෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.503,125 ක් වූ පාරිතෝෂික හා අධිභාර, පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමෙන් ඉවත් කිරීම හා සමාලෝචිත වර්ෂයේදී විධිමත් පරිදි සේවයෙන් ඉවත් වී තිබූ අධිකාරියේ සේවකයින් 15 දෙනෙකුට සහ අධිකාරියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ නොකර සේවයෙන් ඉල්ලා අස් වූ, මිය ගිය හා සේවය හැර ගිය සේවකයින් 06 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.7,325,755 ක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදු කිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් ගිණුම රු.6,822,630 කින් අධිගණනය වී තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී දරා තිබූ රු.6,022,082 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සහ සමුච්චිත අරමුදල් ශේෂය එම වටිනාකමින් පිළිවෙලින් අධි සහ ඌන ගණනය වී තිබුණි.

(ඊ) 2017 වර්ෂයේ අධිකාරියේ ගොඩනැගිලිවල කාමර වෙන් කිරීම (Partition) සඳහා වැයකර තිබූ රු.814,448 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වූ දේපළ පිරියත හා උපකරණ ශේෂය සහ වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් පිළිවෙළින් ඌන සහ අධි ගණනය වී තිබුණි.

(උ) බදුල්ල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම්වලට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.379,920 ක් වූ එකතු කළ අගය මත බදු උපචිත වියදම් ලෙස දක්වා නොතිබුණි.

(ඌ) වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීම් රු.16,960,867 ක් ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට නොනිම් වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(එ) තංගල්ල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය වෙත ව්‍යාපෘතියක් මඟින් ඍජුවම ලබාදී තිබූ ලැප්ටොප් පරිගණක 23 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය සඳහා නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය (SSDP) විසින් ලබාදී තිබූ අරමුදල්වලින් ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වැයකළ රු.21,421,137 ක් වර්ෂයේ ප්‍රාග්ධන ලැබීම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට අයභාර ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වා තිබූ බැංකු ගිණුම් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් ශේෂය රු.3,214,484 ක් වුවද මුදල් පොත අනුව එම ශේෂ එකතුව රු.2,656,555 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එකතුව රු. 557,929 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අම්පාර හා වව්නියාව දිස්ත්‍රික් කාර්යාලවලට අයත් බැංකු ගිණුම් 02 ක මුදල් පොත අනුව පැවති රු.280,660 ක හර ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.51,277 ක අයිරාවක් ලෙස දක්වා තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර තිබූ වටිනාකම රු.59,030,134 ක් වූ ජර්නල් සටහන් 11 කට අදාල විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ජර්නල් සටහන්වල අවශ්‍යතාවය, නිවැරදිතාවය සහ අදාලත්වය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.54,344,471 ක් වූ ණයගැති ශේෂයෙන් වර්ෂ 05 ඉක්ම වූ රු.1,401,630 ක් වූ ණයගැති ශේෂ 24 ක් ද, වර්ෂ 03 ත් වර්ෂ 05 ත් අතර රු.306,481 ක් වූ ණයගැති ශේෂ 03 ක් ද, වර්ෂ 01 ත් වර්ෂ 03 ත් අතර රු.31,300,333 ක් වූ ණයගැති ශේෂ 07 ක් ද පැවති අතර එම ණය ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) 1995 වර්ෂයේ සිට 2016 වර්ෂය අතර කාලය තුළදී අධිකාරිය විසින් විවිධ කටයුතු වෙනුවෙන් ලබාදී තිබූ එකතු වටිනාකම රු.6,361,996 ක් වූ අත්තිකාරම් ශේෂ 53 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.80,863,242 ක් වූ ණයහිමි ශේෂයෙන් වර්ෂ 05 ඉක්ම වූ රු.310,419 ක් වූ ණයහිමි ශේෂ 9 ක් ද, වසර 03 ත් වසර 05 ත් අතර වූ රු.2,018,953 ක් වූ ශේෂ 04 ක් ද, වසර 01 ත් වසර 02 ත් අතර රු.1,330,865 ක් වූ ශේෂ 12 ක් ද 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) විවිධ ණයගැති ශේෂය තුළ 2017 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ අභ්‍යන්තර ගනුදෙනු මත වූ ශේෂය රු.13,436,498 ක් වූ අතර ණයහිමි ශේෂය තුල අන්තර්ගත අභ්‍යන්තර ගනුදෙනු මත වූ ශේෂය රු.8,154,296 ක් විය. මෙම අභ්‍යන්තර ගනුදෙනු මත ණයගැති හා ණයහිමි ශේෂ අතර වර්ෂ 5 ඉක්මවූ නිරවුල් කර නොගත් රු.896,620 ක් වූ ශේෂ 17 ක් විය. වාර්ෂිකව එකිනෙක කාර්යාල විසින් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සැසඳුම්කර ඒ පිළිබඳ එකඟතාවයකට පත් නොවීම මෙම වෙනස්කම් සඳහා හේතු වී තිබුණි.

කෙසේ වුවද 2018 අගෝස්තු 31 දිනට එම ලැබිය යුතු ණය ශේෂය රු.37,417,492 දක්වා ද, ගෙවිය යුතු ශේෂය රු.16,149,511 දක්වා ද, අභ්‍යන්තර ගනුදෙනු මත වූ ණයගැති ශේෂය රු.1,441,000 ක් දක්වා ද අඩු වී ඇති බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද රු.2,317,660 ක් වූ ආයෝජනයන් වෙනුවෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය | උතුරු නැගෙනහිර පළාත් වල විශේෂ ව්‍යාපෘති හා පුහුණු සම්බන්ධ රාජකාරී සඳහා යෙදෙන නිලධාරීන්ට දිනකට රු.3,000 බැගින්ද, පුහුණු අධීක්ෂණ වැඩසටහන් සඳහා උතුරු නැගෙනහිර, මධ්‍යම හා ඌව පළාත්වල රාජකාරිවල යෙදෙන නිලධාරීන්ට දිනකට රු.4,000 බැගින් ආහාර හා නවාතැන් ගාස්තුද මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් රහිතව අධිකාරියේ පාලක මණ්ඩල අනුමැතිය යටතේ ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 02 ක් හා පෙර වර්ෂවල සිදු වූ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 272 ඡේදයේ (3) වගන්තිය | වියදම් කරන ලද මාසය අවසන් වී සති හයක් ඇතුළත සම්පූර්ණ කරන ලද ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් නියැදි විගණනයට අනුව, 2018 ජූලි මාසය වන විටත් සමාලෝචිත වර්ෂයට අදාල වූ ගෙවීම් වවුචර් 287 ක් හා ජර්නල් වවුචර් 37 ක් විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (ඈ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) මහා භාණ්ඩාගාරයේ අනුමැතියෙන් තොරව මධ්‍යම අරමුදලක් (Central Fund) පිහිටුවා තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු.28,087,451 ක් විය.<br><br>(ii) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධිකාරිය තුල මෝටර් බයිසිකල් චක්‍රීය අරමුදල, අර්ධකාලීන පාඨමාලා සඳහා ප්‍රාග්ධන සංචිතය හා අර්ධකාලීන පාඨමාලා වගවීම් අරමුදල යනුවෙන් සංචිත අරමුදල් 3 ක් පිහිටුවා තිබුණි. මධ්‍යම අරමුදලට අමතරව 2017 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදල්වල පැවති මුදල් ශේෂවල එකතුව රු.24,466,123 ක් විය. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව අධිකාරිය සතු මෝටර් රථ 02 ක් රේඛීය අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. |
| (ඊ) | 1994 අප්‍රේල් 20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 හි 2 ඡේදය හා 4.4.1 ඡේදය | ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් වව්නියා, මන්නාරම, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික් වෘත්තීය පුහුණු අවශ්‍යතා සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට ලබා දී තිබූ රු.14,548,292 ක් වූ ආධාර සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර චක්‍රලේඛයේ ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශය හරහා නොව සෘජුවම ආධාර මුදල් ලබාගෙන තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-------------------------------------------------------------

1991 මැයි 02 වන දින අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරිය අතර ඇතිකරගත් 99 අවුරුදු බදු ගිවිසුමට අනුව, අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන ඉඩමේ බදු ගිවිසුමේ 9(ඇ)2 ඡේදයට පටහැනිව, නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව බදු පදනම මත සන්නිවේදන කුළුණු 02 ක් සවිකිරීමට පෞද්ගලික සන්නිවේදන ආයතන 02 ක් වෙත ඉඩ පහසුකම් ලබාදී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.143,056,895 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,878,483 ක් වීමෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.164,935,378 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව භාණ්ඩාගාර ප්‍රදාන රු.136,645,000 කින්, වැඩි වී තිබුණද මෙහෙයුම් වියදම් රු.302,380,550 කින් වැඩි වීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2016 වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තයක් ඇති වී තිබූ නමුත් අනෙකුත් වර්ෂවල මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.411,171,829 ක් වූ අධිකාරියේ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු.688,391,764 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

වැඩ තහනම් කරන ලද නිලධාරීන් පස් දෙනෙකු විසින් අධිකාරියට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ පවරන ලද නඩු 05 ක් විභාග වෙමින් පවතින අතර අධිකාරියට අයත් වැල්ලවත්ත පුහුණු මධ්‍යස්ථානයට අයුතු ඇතුලුවීම හා අනර්ථය සිදුකිරීම සම්බන්ධයෙන් වැල්ලවත්ත පොලීසිය විසින් බාහිර පාර්ශවයකට එරෙහිව නඩුවක් පවරා තිබුණි. එහෙත් ඒ පිළිබඳ කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1. සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 – 2018 වර්ෂ ආවරණය වන පරිදි අධිකාරිය විසින් සංයුක්ත සැලැස්මක් සකස්කර තිබූ නමුත් 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ප්‍රකාරව එය වාර්ෂිකව යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණද වර්ෂය තුල සිදු වී ඇති වෙනස්කම් සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, ප්‍රමුඛතාවය දිය යුතු මූලික අවශ්‍යතා හඳුනාගෙන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබූ අතර ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී ප්‍රමාණවත් පරිදි අයවැයගත ප්‍රතිපාදන කර නොතිබූ අවස්ථා සහ ඒවා ඉටු කිරීමට පාලක සභා අනුමැතිය ලබාගැනීමට කටයුතුකර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි.

(i) තාක්ෂණික නොවන පරීක්ෂකයන් 200 දෙනෙකුට තාක්ෂණික පුහුණුවීම් ලබාදීම සඳහා රු.මිලියන 05 ක් වෙන්කර තිබූ අතර 2017 වර්ෂය තුල රු.මිලියන 3.78 ක් වැයකර නිලධාරීන් 72 ක් සඳහා පමණක් පුහුණුවීම් ලබාදී තිබුණි.

(ii) පරීක්ෂකයන් 30 දෙනෙකු සඳහා වායු සමීකරණ පුහුණුව ලබාදීමටද, රූපලාවන්‍ය පුහුණුව හා පහසුකම් සපයන්නන් (Facilitator Training) 20 දෙනෙකු බැගින් පුහුණු කිරීමට ද සැලසුම්කර තිබූ නමුත් එම නිලධාරීන් සඳහා අදාල පුහුණු පාඨමාලා වර්ෂය තුල පවත්වා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් මගින් මධ්‍යස්ථාන 06 ක් නවීකරණය හා පුහුණු උපකරණ මිලදීගැනීම සඳහා රු.මිලියන 48.5 ක් වෙන්කර තිබුණු අතර වර්ෂය තුල රු.මිලියන 20.23 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව සැලසුම් කළ පරිදි උක්ත කාර්යයන් ඉටුකර නොතිබුණි.

(iv) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් යටතේ සිදු කිරීමට අපේක්ෂිතව තිබූ ගල්ගමුව හා හැව්ලොක් ටවුන් මධ්‍යස්ථාන නවීකරණ කටයුතු ඉහළ කළමනාකරණයේ උපදෙස් මත නවතා තිබූ අතර නතර කිරීම සඳහා සාධාරණ හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) පාඨමාලා සඳහා බඳවා ගැනීම් හා පාඨමාලා හැරයාම්

---------------------------------------------------------

(i) 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව මධ්‍යස්ථාන පාදක අර්ධ කාලීන පාඨමාලා හා භාෂා කුසලතාවය සහ මෘදු කුසලතාවය සඳහා බඳවා ගැනීම් ඉලක්කගත සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 58 ක් හා සියයට 16 ක් වී තිබුණි. 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ විශේෂ ව්‍යාපෘති සඳහා ආධුනිකයින් 7,486 ක් බඳවා ගෙන තිබූ අතර එය සමස්ත බඳවාගැනීම්වලින් සියයට 15 ක් නියෝජනය කෙරුණි. සභාපතිවරයාගේ පිළිතුර අනුව උපදේශකවරුන්ගේ දීමනා ප්‍රමාණවත් නොවීම නිසා උපදේශකවරුන් බඳවා ගැනීමේදී පැවති අපහසුකම් ඉලක්ක ලඟා කර ගැනීමට බාධාවක් වී තිබුණි.

(ii) මධ්‍යස්ථාන පාදක, කර්මාන්ත පාදක හා ජාතික ආයතනවල පුහුණු පාඨමාලවල වර්ෂය තුලදී පාඨමාලා හැරයාම් පිළිවෙලින් සියයට 14, 28 හා 18 ක් බැගින් විය. මෙයින් කර්මාන්ත පාදක පුහුණු කටයුතුවල පාඨමාලා හැරයාම් ඉතා ඉහළ මට්ටමක පැවතුණු අතර මෙම හැරයාම් අවම කර ගැනීම සඳහා අධිකාරිය විසින් අවශ්‍ය පරිදි උපදේශකවරුන්ගේ සේවය ලබා දී නොතිබුණි.

(iii) 2017 වර්ෂයේ ජාතික ආයතන හැර දිස්ත්‍රික් මට්ටමින් පුහුණුව හැරයාම් සැලකීමේදී වැඩිම හැරයාම් වූ සියයට 24 ක් කළුතර දිස්ත්‍රික්කයෙන් නිරීක්ෂණය වූ අතර සමස්ත දිස්ත්‍රික් 25 සැලකීමේදී දිස්ත්‍රික් 17 ක පාඨමාලා හැරයාම් සියයට 10 කට වඩා වැඩි වී තිබුණි.

(iv) ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ වැඩිම පාඨමාලා හැරයාම් ප්‍රමාණය ඉලෙක්ට්‍රොනික ශිල්පී හා ජලනල කාර්මික ශිල්පී පාඨමාලාවල සිදු වී තිබුණි. සභාපතිවරයාගේ පිළිතුර අනුව ආධුනිකයින්ගේ ආර්ථික දුෂ්කරතා සහ උසස් අධ්‍යාපනයට යොමුවීම මෙම හැරයාම් සඳහා හේතු වී තිබුණි.

(v) මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව සඳහා ජාතික ආයතන හැර සමාලෝචිත වර්ෂය සඳහා පැවති ඉල්ලුම 8,066 ක් වුවද ඉල්ලුම සම්පූර්ණ කිරීම සඳහා අධිකාරිය සතු ධාරිතාවය 5,537 ක් හෙවත් සියයට 69 ක පමණක් වූ අතර සත්‍ය බඳවා ගැනීම් ප්‍රමාණය 5,416 ක් වී තිබුණි. ඒ අනුව පාඨමාලා සඳහා පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීමට තරම් ධාරිතාවයක් අධිකාරිය සතුව නොතිබුණි. කෙසේ වුවද මහනුවර දිස්ත්‍රික්කය තුල මධ්‍යස්ථාන පාදක පුහුණු ධාරිතාවය ආධුනිකයින් 340 ක් වුවත් වර්ෂය තුල බඳවා ගැනීම් සියයට 69 ක් හෙවත් 233 ක් පමණක් විය.

(vi) ජාතික ආයතන 04 හි පාඨමාලා සඳහා 2017 වර්ෂයේදී පැවති ඉල්ලුම 5776 ක් වුවත් අධිකාරිය සතුව පැවති සැපයුම් ධාරිතාවය 1631 ක් බව නිරීක්ෂණය වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 28 කි. ඒ අනුව ජාතික ආයතන මගින් ආර්ථිකයට ලබාදිය හැකි දායකත්වය වර්ධනය කිරීම සඳහා ධාරිතාවය ඉහළ නැංවීමට අවශ්‍ය බව නිරීක්ෂණය විය.

(vii) 2017 වර්ෂයේ මධ්‍යස්ථාන පාදක පුහුණුව යටතේ පාඨමාලා 45 ක් පවත්වා තිබූ අතර ඒ සඳහා බඳවාගැනීම් සියයට 49 ක් වී තිබුණි.

(ඇ) පාඨමාලා නොපැවැත්වීම
-----------------------------

ක්‍රියාකාරී සැලැස්ම තුල වූ කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව යටතේ පාඨමාලා 46 ක් සඳහා ආධුනිකයන් බඳවාගෙන නොතිබුණි.

(ඈ) පරීක්ෂණ පැවැත්වීම සහ සහතික පත්‍ර නිකුත් කිරීම
------------------------------------------------------

2017 වර්ෂය තුලදී ආධුනිකයන් සඳහා පවත්වා තිබූ පරීක්ෂණ සංඛ්‍යාව 36,116 ක් වූ අතර අවසන් පරීක්ෂණය සමත් වූ සංඛ්‍යාව 28,358 ක් වූ අතර ඒ අනුව අවසන් වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම පමා වීම වැනි හේතූන් මත අවසන් වෘත්තීය පරීක්ෂණ සඳහා පෙනී නොසිටි සහ සමත් නොවූ සංඛ්‍යාව සියයට 21 ක් විය. තවද 2017 වර්ෂය තුලදී සහතික පත්‍ර 22,059 ක් ලබා දී තිබුණි.

(ඉ) පාඩම් මාලා බෙදාහැරීම
----------------------------

යාපනය, මන්නාරම, මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික් සඳහා පාඩම් මාලා බෙදාහැරීම සිදුකර නොතිබුණි. කාර්මික දැනීම් සහිත දෙමළ භාෂා පරිවර්තකයන්ගේ පවතින හිඟය නිසා පාඩම් මාලා පරිවර්තනය කිරීමේ ප්‍රමාදය මේ සඳහා හේතු වී ඇති බව සභාපතිවරයාගේ පිළිතුරු මගින් මා වෙත දන්වා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයට 2009 නොවැම්බර් 01 දින සිට පැවරුම් පදනම මත නාවික ඉංජිනේරු විෂයය සඳහා කථිකාචාර්යවරයෙකු ලෙස බඳවාගෙන තිබූ නිලධාරියෙකුගේ සේවය 2017 මාර්තු 23 දින හදිසියේ අත්හිටුවා තිබුණි. එම නිලධාරියා

විසින් මෙම තීරණයට එරෙහිව මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට කරන ලද පැමිණිල්ලකට අනුව අදාල පනත්වලට හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අනුව කටයුතු නොකිරීම නිසා නිලධාරියා වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු සේව්‍ය හා සේවකයාගේ දායක මුදල් හා සේවක භාරකාර අරමුදල් අධිභාර, සේවක පාරිතෝෂික රු.2,256,125 ක් හා අධිභාර රු.1,091,177 ක් ඇතුලු රු.3,347,302 ක් වර්ෂය තුලදී ගෙවීමට සිදු වී තිබුණි. කළමනාකරණය විසින් බඳවාගැනීමේ කොන්දේසි සහ පවත්නා නීතිරීති පිළිබඳ සැලකිලිමත් නොවීම නිසා මෙම අධිභාර මුදල් ගෙවීමට සිදු වී තිබුණු බව නිරීක්‍ෂණය වූ අතර එම ප්‍රමාණයෙන් අධිකාරියට අලාභයක් සිදු වී තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමේදී “මුළු ඉපයීම” යන්න චක්‍රලේඛවලට අනුකූලව නිවැරදිව අර්ථකථනය කර නොගැනීම හේතුවෙන් අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අනුව 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලසීමාවට අදාලව අධිකාරියේ සේවකයන්ට ගෙවන ලද ජීවන වියදම් දීමනාව මත සේවක භාරකාර අරමුදල් හා සේවක අර්ථසාධක අරමුදල් ගෙවා නොතිබුණි. අධිකාරියේ දළ ගණනය කිරීම් අනුව හිඟ දායක මුදල රු.135,129,295 ක් වූ අතර 2018 සැප්තැම්බර් 15 දින දක්වාම කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. තවද, නියමිත පරිදි ගෙවීම් නොකිරීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදලේ සියයට 8 ක් වූ සේවක දායක මුදල හා ගෙවීම් ප්‍රමාදය නිසා පැනවීමට ඉඩ ඇති අධිභාර මුදල් ඉහත ගෙවීම්වලට අමතරව ගෙවීමට සිදුවීමේ අවධානමක් අධිකාරිය වෙත පවතින බවත් නිරීක්‍ෂණය විය.

(ඇ) අධිකාරිය හා පෞද්ගලික සේවා සැපයුම් ආයතනයක් අතර පවිත්‍රතා සේවා සැපයීම සඳහා 2017 අප්‍රේල් 07 දින මාසිකව රු.892,500 ක් ගෙවීමේ පදනම මත ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව, දෛනිකව සේවයේ යෙදිය යුතු සේවකයින් නිසි ලෙස සේවයේ යොදවා නොතිබූ අතර පවිත්‍රතා කටයුතු නිසි පරිදි ඉටුනොකර තිබියදී පවතින අඩුපාඩු කෙරෙහි අවධානය යොමු නොකර 2018 මැයි 31 දින දක්වා අවස්ථා 04 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝකර තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මධ්‍යස්ථාන තුළ උපකරණ හා ඉන්වෙන්ට්‍රි අයිතම 547 ක ඌනතාවයක් පැවති අතර භෞතිකව පැවති ඉන්වෙන්ට්‍රි අයිතම 262 ක් තොග පොතට ඇතුළත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර පරීක්‍ෂාවට ලක්වන ආකාරයට ජර්නල් වවුචර් පරීක්‍ෂාව හා අනුමත කිරීම, පරිගණක ගිණුම් පද්ධතියට ගනුදෙනු ඇතුළත් කිරීම, චෙක්පත් අත්සන් කිරීම, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම යනාදී මූල්‍ය අංශයේ රාජකාරී වැඩ බෙදීමකින් තොරව එකම නිලධාරියෙකු සිදුකර තිබුණි.

(ඇ) වසර 01 ත් වසර 10 ත් අතර කාලයක සිට ඉදිකිරීම් හා නවීකරණ ව්‍යාපෘති 08 කට අදාලව රු.29,484,608 ක් පැවති කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවති අතර එම ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇගයීම්කර අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

-------------------------------------

අධිකාරියේ වාර්තා අනුව ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින් 2015, 2016 හා 2017 වර්ෂයන් තුල ලබා දී තිබූ ආධාරවල වටිනාකම රු.14,548,293 ක් වූ අතර අදාල වියදම් ගිණුම අනුව ඉන් දරන ලද වියදම රු.10,517,319 ක් වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ආධාර ගිණුමේ ශේෂයක් නොතිබූ බැවින් රු.4,030,974 ක ලැබීම්, වියදම් කර තිබුණේද ඉතිරි වී තිබුණේද යන්න තහවුරු නොවුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ නිලධාරීන්ට පැලදීම සඳහා 2014 වර්ෂයේදී මිලදීගෙන තිබූ වටිනාකම රු.23,100 ක් වූ අධිකාරියේ ලාංඡන 154 ක් 2018 අගෝස්තු 16 දින වන විටත් වසර 03 කට අධික කාලයක් ප්‍රධාන ගබඩාව තුළ නිශ්කාර්යව පවතින බව නිරීක්‍ෂණය විය.

(ආ) අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමෙන් තොරව 2017 වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.12,500 ක් වටිනා ලෝහ පැන් (රිදී) 50 ක් වසරකට අධික කාලයක් ප්‍රධාන ගබඩාව තුල නිශ්කාර්යව පැවතුණි.

(ඇ) 2014 අගෝස්තු 13 දින ප්‍රධාන ගබඩාවට ලැබී තිබූ වර්ග 08 කට අයත් රු.1,395,744 ක් වටිනා පුහුණු උපකරණ අයිතම 2,458 ක් වසර 04 කට අධික කාලයක සිට නිශ්කාර්යව පවතින බව විගණනයේදී නිරීක්‍ෂණය විය. පුහුණු අංශය මගින් මෙලෙස නිශ්කාර්යව පවතින පුහුණු උපකරණ හඳුනාගෙන ඒවා ඵලදායී ලෙස යෙදවීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ඈ) මුද්‍රණ යන්ත්‍ර සඳහා මිලදීගෙන තිබූ රු.355,500 ක් වූ ටෝනර් කාට්රිජ් 58 ක් හා ප්‍රින්ටර් රිබන් 11 ක් මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් ඉවත් කිරීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) 2015 වර්ෂයේදී ගබඩාවට ලැබී තිබූ රු.176,151 ක් වටිනා ටෝනර් කාට්රිජ් 12 ක් වසර 02 කට වැඩි කාලයක සිට නිකුත් කිරීමෙන් තොරව ගබඩාවේ පැවතුණි.

**4.6 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් අධිකාරියේ සම්පත්**

------------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 8.3.9 ඡේදය සහ 9.4 වගන්ති වල සඳහන් කරුණු වලට පටහැනිව අධිකාරියේ සේවකයන් හත්දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට හා දෙදෙනෙකු අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත 2008 මැයි 28 දින සිට මුදාහැර තිබූ අතර මුදාහල කාලය මාස 05 සිට වර්ෂ 09 දක්වා කාල පරාසයක විය. වෙනත් ආයතන වලට මුදා හැර තිබූ නිලධාරීන් අටදෙනෙකුගේ වැටුප් එම අනුයුක්ත කරන ලද ආයතන වලින් 2017 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිපූරණය කර ගත යුතු වුවද රු.2,769,020 ක වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලය 1,358 ක් වූ අතර කොන්ත්‍රාත් පදනම මත සේවය කරන 55 දෙනෙකුද ඇතුලුව තථ්‍ය කාර්ය මණ්ඩලය 1,128 ක් විය. ඒ අනුව ස්ථිර පුරප්පාඩු සංඛ්‍යාව 230 ක් වූ අතර එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. කථිකාචාර්ය, උපදේශක හා පරීක්ෂක යන අධ්‍යයන කාණ්ඩයේ තනතුරු 128 ක් පුරප්පාඩුව පැවති අතර එය ආයතනයේ පුහුණු හා පරීක්ෂණ කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිකරන බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියට ස්ථිර නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකර 2011 වර්ෂයේ සිට අධිකාරියේ ඉදිකිරීම් හා නඩත්තු අංශයේ පැවැරුම් පදනම මත නිළධාරියෙකු සේවයේ යොදවා තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව සම්බන්ධීකාරක තනතුරක් ඇති කර එම තනතුර සඳහා 2016 මැයි 02 දින පුද්ගලයෙකු බඳවාගෙන තිබූ අතර ව්‍යාපෘති අරමුදල් මගින් එම නිලධාරියාට වැටුප්, වාහන සහ ඉන්ධන දීමනා ලෙස 2016 වර්ෂය තුලදී එකතුව රු.585,569 ක් ගෙවා තිබුණි.

තවද නිපුණතා සභාවලට අදාලව පවත්වන සාකච්ඡා සම්බන්ධීකරණය හා සංවිධානය කිරීම මෙම නිලධාරියාගේ කාර්යය භාරය වී තිබූ අතර නියදි පරීක්ෂාවකදී අනාවරණය වූ පරිදි මෙම නිළධාරියා 2016 දෙසැම්බර් මාසයේදී දින10 ක්ද 2017 ජනවාරි සිට අප්‍රේල් දක්වා දින 26 ක්ද වශයෙන් දින 36 ක් පමණක් සේවය කර තිබුණු අතර වැටුප් හා දීමනා වශයෙන් 2017 අප්‍රේල් දක්වා එකතුව රු.420,200 ක් වූ දීමනා ලබා දී තිබුණි. ඒ අනුව වැඩ කරන එක් දිනකට රු.11,672 ක පමණ වැටුපක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

**05. තිරසාර සංවර්ධනය**

2017 අගෝස්තු 14 දිනැති අංක එස්පී/එස්ජී/එස්ඩීජී/17 දරන රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය ආරක්ෂක ලේකම්ගේ ලිපිය හා තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් තම විෂයට වැටෙන කාර්යයන් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සන්දිස්ථානයන්ද ඉලක්ක මත ලඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දින 81 ක ප්‍රමාදයකින් පසුව 2018 මැයි 21 දින සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව පාලක මණ්ඩල අනුමැතිය මත එහි සාමාජිකයන් දෙදෙනෙකු විසින් අත්සන් කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල එක් පාලක මණ්ඩල සාමාජිකයෙකු විසින් පමණක් අත්සන් කර තිබුණි. ඊට අමතරව පාලක මණ්ඩල සාමාජිකයෙකු නොවන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාද පාලක මණ්ඩලය වෙනුවෙන් එයට අත්සන් යොදා තිබුණි.

## 6.2 අභ්‍යන්තර විගණනය

-----------------------

අධිකාරියේ අභ්‍යන්තර විගණන ඒකකයට නිලධාරීන් 08 දෙනෙකු අනුයුක්ත කර තිබූ නමුත් විගණන සැලැස්මට අනුකූලව අභ්‍යන්තර විගණනයන් සිදුකර නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-------------------------------------------

### 6.3.1 ප්‍රසම්පාදනයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය මගින් සිදු කර තිබූ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2. ඡේදය ප්‍රකාරව බදුල්ල පුහුණු මධ්‍යස්ථානය නවීකරණය හා යාපනය දිස්ත්‍රික් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම් කොන්ත්‍රාත්වලට අදාල මුළු පිරිවැය ඇස්තමේන්තු ආයතන ප්‍රධානියා විසින් අනුමත කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ඡේදය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේදී කොන්ත්‍රාත් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට සති 03 ක් එනම් දින 21 ක් ලබා දිය යුතු නමුත් එම විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රාත් 01 කට අදාලව ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 18 ක් පමණක් ලබාදී තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13 ඡේදය ප්‍රකාරව ඇස්තමේන්තු කොන්ත්‍රාත් වටිනාකම සියයට 10 ඉක්මවූ කොන්ත්‍රාත් විචලන නියෝග සඳහා අදාල ප්‍රසම්පාදන කමිටුවලින් අනුමැතිය ලබාගත යුතු වුවත් කොන්ත්‍රාත් 02 කට අදාල රු.6,257,001 ක් වූ අමතර වැඩ සඳහා අදාල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

### 6.3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බදුල්ල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කාර්යයන් 2016 සැප්තැම්බර් 18 වන දින අවසන් කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දින වන විටද ඉදිකිරීම් නිමකර නොතිබූ අතර දින 496 ක් ඉදිකිරීම් ප්‍රමාද වී තිබුණි. ඒ අනුව ගිවිසුමේ ප්‍රකාරව සියයට 10 ක උපරිම ප්‍රමාද ගාස්තු අයකල යුතු වුවත් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. තවද 2018 මැයි 16 වන දින වන විටත් වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කොට අධිකාරිය වෙත ගොඩනැගිල්ල භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) (i) 2018 අප්‍රේල් 09 දිනැති අංක එන්ජ්අයිටීජ්/18/ජීජ්/11-II (Construction) දරන කුරුණෑගල දිස්ත්‍රික් කළමනාකරණ (වැඩ ආවරණ) ගේ ලිපියට අනුව, කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල සියලු ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ සියයට 90 ක ගුණාත්මකභාවයකින් අවසන් කර ඇති බැවින් ගෙවීම් කිරීමට නිර්දේශ කර තිබුණි. එසේ දිස්ත්‍රික් කළමණාකරු විසින් තාක්‍ෂණ නිලධාරියෙකුගේ සහතිකයක් ලබා නොගෙන ඉදිකිරීම්වල ගුණාත්මකභාවය තීරණය කිරීම විගණනයේදී ගැටලුකාරී විය.

(ii) 2018 අප්‍රේල් 09 දින වන විට කොන්ත්‍රාත් ගිවිසුම් අනුව වැඩ අවසන් කිරීම දින 107 කින් ප්‍රමාද වී තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14 ඡේදය ප්‍රකාරව විධිමත් පරිදි කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර නොතිබුණි.

(iii) කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු (Liquidated damages) ලෙස දිනක් සඳහා මූලික කොන්ත්‍රාත් වටිනාකමින් 1/4000 ක් අයකළ යුතු වුවත් ඉදිකිරීම් ප්‍රමාදය වෙනුවෙන් අයකළ යුතු රු.158,438 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමකින් තොරව අවසාන බිල්පත්‍රය සඳහා ගෙවීම් කිරීමට අධිකාරියේ සභාපති විසින් අනුමැතිය ලබා දී තිබුණි.

(ඇ) (i) නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ සාකච්ඡා කාමරය නවීකරණය කිරීම සඳහා රු.2,134,127 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. කොන්ත්‍රාත්තුව යටතේ 2017 සැප්තැම්බර් 05 දිනට වැඩ නිම කළ යුතු නමුත් නවීකරණ කටයුතු 2017 දෙසැම්බර් 31 දින අදාල ඉදිකිරීම් නිමකර භාර දී තිබූ බව කොළඹ දිස්ත්‍රික් කළමණාකරු විසින් දක්වා තිබුණද නිමකර භාරගත් බවට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ඡේදය ප්‍රකාරව වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉංජිනේරුවරයා / උපදේශකවරයා විසින් නිකුත් කර නොතිබුණි.

(ii) සාකච්ඡා කාමරයේ නවීකරණ කටයුතු අවසන් කිරීමට මාස 03 දින 06 ක් ප්‍රමාද වී තිබූ නමුත් ලංසු ලේඛනයේ පරිදි ප්‍රමාද වන එක් දිනයක් වෙනුවෙන් කොන්ත්‍රාත් වටිනාකමින් 1/4000 ක් වූ ප්‍රමාද ගාස්තු අයකළ යුතු වුවත් රු.51,219 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමකින් තොරව අවසන් බිල්පත ගෙවා තිබුණි.

(ඈ) (i) යාපනය දිස්ත්‍රික් කාර්යාල පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සකස්කර තිබූ වටිනාකම රු.18,847,582 ක පිරිවැය ඇස්තමේන්තුව රු.19,735,082 ක් ලෙස සංශෝධනයකර තිබූ අතර ඒ සඳහා සභාපතිගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද අධිකාරියේ පැවරුම් පදනම මත බඳවාගෙන ඇති නිලධාරියෙකු ඉදිකිරීම් හා නඩත්තු අංශයේ අංශ ප්‍රධානී ලෙස කටයුතු කර තිබූ අතර ඇස්තමේන්තුව සංශෝධනය කිරීම, කොන්ත්‍රාත් ලිපි සඳහා අත්සන් තැබීම ඇතුළු ඉදිකිරීම් අංශයේ සියලු කටයුතු එම නිලධාරියා විසින් සිදුකර තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 (ඇ) ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා රේඛීය අමාත්‍යාංශයේ හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයට බාහිර විෂය සම්බන්ධ දැනුමක් ඇති නිලධාරියෙකු සම්බන්ධ වී නොතිබුණි.

(iii) ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලසුම් සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් 2015 මාර්තු 02 වන දින යාපනය ප්‍රාදේශීය සභා සැලසුම් නිළධාරී විසින් තහනම් නියෝගයක් නිකුත්කර තිබූ අතර ඒ වන විට කොන්ත්‍රාත්කරු වෙත රු.3,399,069 ක් වූ අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි.

(iv) කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ආරම්භ කර මාස 06 ක් තුල එනම් 2015 ජුනි 22 වන දින ඉදිකිරීම් අවසන් කළ යුතුව පැවතුණද 2018 අගෝස්තු 30 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන්කර නොතිබුණි.
කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ හේතූන් අතරින් අයහපත් කාලගුණික තත්ත්වය හැර අනෙකුත් හේතූන් සාධාරණ හේතු ලෙස විගණනයේදී නිරීක්ෂණය නොවුණි. තවද කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම අධිකාරියේ සභාපති විසින් සිදුකළ යුතු අතර ඊට පටහැනිව හා අධිකාරී බලතල ඉක්මවා අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්) කාලය දීර්ඝ කිරීම සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

ඉදිකිරීම් භූමියේ පස්, ඉදිකිරීම් කිරීමට සුදුසු මට්ටමක නොමැතිවීම තුලින් අගල් 4 ½ ක මතුපිට පස් ඉවත්කිරීමට සිදු වූ බව කොන්ත්‍රාත් ආයතනය දන්වා තිබූ අතර සැලසුම් අවස්ථාවේදී භූමිය පරීක්ෂාවක් සිදු කිරීමට අධිකාරිය කටයුතු නොකිරීම මෙවැනි ගැටලුකාරී තත්ත්වයක් ඇතිවීමට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

(v) ඉදිකිරීම් කටයුතුවලදී පරිසර ආරක්ෂණය පිළිබඳව අධිකාරියේ වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු නොවීමෙන් යාපනය දිස්ත්‍රික් මහජන සෞඛ්‍ය පරීක්ෂණක විසින් ඉදිකිරීම් පරිශ්‍රයේ පවතින අපිරිසිදුතාවය හේතුවෙන් ඩෙංගු අවධානම් සහිත කලාපයක් ලෙසට රතු නිවේදනයක් නිකුත්කර රු.25,000 ක දඩයක්ද අධිකාරිය වෙත පනවා තිබුණි.

(vi) 2017 ජනවාරි 30 දිනැති අධිකාරියේ සභාපතිවරයාගේ ලිපිය මගින් ඉදිකිරීම් වැඩ අවසන් කර ඇති ගොඩනැගිල්ලේ පවතින දෝෂ නිවැරදි කර නොමැති බවත් ගොඩනැගිල්ල භාරගැනීමට ප්‍රථම එම දෝෂ නිවැරදි කරන ලෙසත් කොන්ත්‍රාත් ආයතනයට දන්වා තිබුණද 2018 අගෝස්තු 30 දින වන විටත් දෝෂ නිවැරදි කොට ගොඩනැගිල්ල භාර දී නොතිබුණි.

## 6.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 නොවැම්බර් 23 දිනැති සංශෝධිත අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් අතර සියයට 10 සිට සියයට 211 දක්වාද, ප්‍රාග්ධන වියදම්වල සියයට 15 සිට සියයට 460 දක්වාද විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) අයවැය මගින් පුනරාවර්තන වැය විෂයයන් 04 ක් සඳහා වෙන්කරන ලද රු.2,000,000 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 08 ක් සඳහා වෙන්කරන ලද රු.5,580,000 ක මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

## 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයෙන් අය විය යුතු, 2014 වර්ෂයේ දී ලෝක තරුණ සමුළුව සඳහා අධිකාරිය වැය කර තිබූ රු.2,000,000 ක මුදල ලැබිය යුතු ශේෂ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී කටුබැද්ද ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ශිෂ්‍ය නේවාසිකාගාරයේ සවිකර තිබූ අකුණු සන්නායක තඹ පටියේ අඩි 25 ක පමණ ප්‍රමාණයක් නැතිවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඇ) කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු පාඨමාලාවල විෂයමාලාවලට අවශ්‍ය කාලීන සංශෝධන සිදු කිරීම සඳහා අධිකාරිය විසින් පෞද්ගලික සමාගමක් සමග 2014 මැයි මාසයේදී රු.3,231,500 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. 2014 සැප්තැම්බර් 24 දින ගිවිසුම්ගත කාර්යය අවසන් කළ යුතුව තිබූ අතර ඒ සඳහා 2014 වර්ෂයේ දී රු.1,809,640 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි. නමුත් 2018 අගෝස්තු 15 දින වනවිට වසර 04 පමණ කාලයක් ගතවී තිබුණත් අදාළ කාර්යය සිදු නොකර අත්හැර දමා තිබුණි. අත්තිකාරම් මුදල් ගෙවීම වෙනුවෙන් ලබා දී තිබූ රු.723,856 ක බැංකු ඇපකරය 2014 ජූලි 31 දිනෙන් අවසන් වී තිබූ අතර ගෙවන ලද අත්තිකාරම් මුදල් අයකර ගැනීමට නොහැකිවීමෙන් එම ප්‍රමාණයෙන් අධිකාරියට පාඩුවක් සිදුකර තිබුණි. 2018 සැප්තැම්බර් 18 දින අදාල සමාගමේ නිලධාරීන් කැඳවා මේ පිළිබඳ සාකච්ඡා කර ඉදිරි කටයුතු කරගෙන යාමට නැවත තීරණය වී ඇති බව සභාපතිවරයාගේ පිළිතුර අනුව මා වෙත දන්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් රාජසන්තක කරන ලද ටොයෝටා කොරෝනා වර්ගයේ වාහනය 2010 වර්ෂයේ දී රු.1,134,000 ක් වූ වටිනාකමට අධිකාරිය විසින් මිලදීගෙන තිබුණි. එසේ වුවද එම වාහනය අධිකාරිය විසින් ලියාපදිංචිකර හෝ ධාවනයේ යොදවා නොතිබූ අතර 2016 නොවැම්බර් 29 දින එහි එන්ජිම පුහුණු කටයුතු සඳහා කිලිනොච්චිය ජර්මානු පුහුණු ආයතනය වෙත ලබා දී තිබුණි.

එම රථයේ ධාවන තත්ත්වය සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශන වාර්තාව අනුව භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ගාල්කිරීම හා නිසි පරීක්ෂාවකින් තොරව මිලදී ගැනීම් කළ නිලධාරීන්ට හා මිලදී ගැනීමෙන් පසු කඩිනම් පියවර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගැනීමට නිර්දේශ කර තිබුණ ද අදාල නිලධාරීන්ට විරුද්ධව විනය පියවර ගෙන නොතිබුණි.

(ඉ) නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලන) තනතුරට බඳවා ගැනීමට පලකළ පුවත්පත් දැන්වීමට අනුව එම තනතුරට අදාළ මූලික වැටුප ලෙස රු.38,530 ක් ලෙස දක්වා තිබූ නමුත් 2009 නොවැම්බර් 10 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ උපදෙස් ලිපියට පටහැනිව, එම තනතුරට බඳවාගත් නිලධාරියාගේ ආරම්භක වැටුප් පියවර ලෙස රු.25,640 ක් පත්වීම් ලිපියේ දක්වා තිබුණි. මෙම නිලධාරියා විසින් පුවත්පත් දැන්වීමේ සඳහන් වැටුප ගෙවන ලෙස ආයතනයෙන් ඉල්ලා තිබුණද වැටුප නිවැරදි නොකිරීම මත එම ඉල්ලීම කම්කරු කොමසාරිස් ජනරාල් වෙත යොමුකර තිබුණි. එහිදී දෙපාර්ශවය එකඟ වූ වැටුප් පරිමාණය හා හිඟ වැටුප්, තනතුර භාරගත් දින සිට නිවැරදි කරන ලෙසට උපදෙස් ලබා දී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අදාල නිලධාරියාට එකතුව රු.436,805 ක හිඟ වැටුප් ගෙවීමට අධිකාරියට සිදුවී තිබුණි. මෙම පත්වීම් සිදුකිරීමට කටයුතු කළ වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඊ) අධිකාරියේ උප සභාපතිවරයා විසින් 2015 සැප්තැම්බර් 17 දින මධ්‍යම කළමනාකරණ මට්ටමට අයත් නිලධාරියකුගේ සේවය ස්ථිර කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට පෞද්ගලික ලිපිගොණුව සභාපතිවරයා වෙත ඉදිරිපත්කර තිබූ අවස්ථාවේ අදාල කාර්යසාධන වාර්තාව එම නිලධාරියාගේ අනුදැනුම මත ඉවත්කර වෙනත් කාර්ය සාධන වාර්තාවක් අමුණා තිබූ බව සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්) ගේ 2015 සැප්තැම්බර් 23 දිනැති සටහන මඟින් අනාවරණය කරගෙන තිබුණි. එහෙත් ඊට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(උ) අධිකාරියට අයත් වාහනයක් 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා එන්ජිමේ අළුත්වැඩියාවක් සඳහා ධාවනයෙන් ඉවත්කර ඔරුගොඩවත්ත පරිශ්‍රයේ ගාල්කර තිබූ අතර 2011 වර්ෂයේ දී එය අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.918,428 ක් වුවද 2014 වර්ෂය වන විට එය රු.1,683,500 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද, 2014 වර්ෂයේදී මෙම වාහනය අලුත්වැඩියා කර තිබූ අතර 2016 මාර්තු 15 දින ගිනි ගැනීමකට ලක්ව තිබුණි. එහෙත් 2017 නොවැම්බර් 23 දින වන විටත් එය නැවත අලුත්වැඩියා නොකර පෞද්ගලික ගරාජයක ගාල්කර තිබූ අතර රක්ෂණ ආයතනයෙන් ලබාදී තිබූ රු.110,040 කට අදාලව පමණක් අළුත්වැඩියාව සිදුකර තිබුණි. කෙසේ වුවද රථය ධාවන තත්ත්වයට පත්කිරීමට නොහැකි වී ඇති බව සභාපතිවරයා විසින් පිළිතුරු මගින් මා වෙත දන්වා තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගබඩා පාලනය | මිලදී ගත් ඇතැම් ගබඩා ද්‍රව්‍ය පොත්වලට ඇතුලත් නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය | අනුමත බඳවා ගැනීමේ පරිපාටියට පරිබාහිරව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම. |
| (ඇ) අරමුදල් කළමනාකරණය | විධිමත් අනුමැතියකින් තොරව සංචිත අරමුදල් පවත්වාගෙන යාමට ඉඩහැරීම නිසා මුදල් නිෂ්කාර්යව පැවතීම. |
| (ඈ) ගිණුම්කරණය | (i) ජර්නල් සටහන් යෙදීමේදී නිශ්චිත සීමාවන් පවරමින් නිළධාරීන්ට අධිකාරී බලය ලබා දී නොතිබීම. |
| | (ii) අධිකාරියේ වවුචර් අපිළිවෙලින් සහ අසම්පූර්ණව ගොනුගත කිරීම් සහ වගකිවයුතු නිලධාරියෙකුගේ පරීක්ෂාවකින් තොරව විගණනයට ඉදිරිපත් කිරීම. |
| | (iii) ජර්නල් සටහන් යෙදීම ගිණුම් ශේෂ වෙනස් වීම් පරිගණක පද්ධතිය මගින් පාලනය නොවීම. විධිමත් පාලනයකින් තොරව ජර්නල් සටහන් ගිණුම් පද්ධතියට ඇතුළත් කිරීම. |
| | (iv) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අතින් සකස් කරන අතර (Manual) ගිණුම්කරණ පද්ධතියේ ඇතුලත් සංඛ්‍යා සමඟ සන්සන්දනය කර වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන ගැලපීම් සිදුකර නොතිබීම. |
| | (v) සරල බව තේරුම්ගත හැකි වන බව ආරක්ෂාවන පරිදි අවසන් ගිණුම් සකස් නොකිරීම. |
| (ඉ) කොන්ත්‍රාත් පරිපාලනය | ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධ ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකිරීම. |